සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**මධ්‍ය වාර පරීක්ෂණය 2015**

**11 ශ්‍රේණිය**

# පෙරදිග සංගීතය

**කාලය පැය 2 යි. වි. 30 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

## I කොටස

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **වඩාත් ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01 නි ස ග ම ප නි ස යනුවෙන් ආරෝහණය යෙදෙන රාගය වන්නේ,
(1) යමන් (2) භූපාලි (3) භීමපලාශ්‍රී (4) භෛරවී

02 සැළලිහිණි සංදේශය, ගුත්තිල කාව්‍ය, මයුර සංදේශයෙහි එන ගීත
(1) ගැමි ගී (2) සේ ගී (3) ප්‍රශස්ති (4) හටන් ගී

03 සිංහල චිත්‍රපට සංගීතය සඳහා මුල් යුගයේ දී බෙහෙවින් ඉවහල් වී ඇති සංගීත සම්ප්‍රදාය වූයේ,
(1) බටහිර සම්ප්‍රදායයි. (2) හින්දුස්ථානි සම්ප්‍රදායයි.
(3) වංග සම්ප්‍රදායයි. (4) දකුණු ඉන්දීය සම්ප්‍රදායයි.

04 දෘශ්‍ය කාව්‍ය වර්ගයට අයත් ගීතයකි
(1) මෙහෙ ගී (2) වැළපුම් ගී (3) නූර්ති ගී (4) හටන් ගී

05 ගුඳ | ගුඳ | ගඳි | ගත යන මෙම පෙර පදය වැයීමට සුදුසු වන්නේ,
(1) රබාන (2) ගැටබෙරය (3) දවුල (4) පහතරට බෙරය

06 ''පාරමිතා බල පූරිත පූජිත'' ගීතය සඳහා සංගීත නිර්මාණය කිරීමේ දී ඇසුරු කළ හින්දුස්ථානි රාගය වන්නේ,
(1) භෛරවී (2) යමන් (3) බිලාවල් (4) භීමපලාශ්‍රී

07 ස්වර ලිපි බලා වාදනය කිරීමේ දී $^{3}/_{4}$ යන ආකාරයෙන් දක්වා ඇත්තේ නම් එය සමාන වනුයේ,
(1) ත්‍රි තාලයටයි. (2) දාදාරා තාලයටයි.
(3) ජප් තාලයටයි. (4) කෙහේර්වා තාලයටයි.

08 රාගයකට ඇති සතුරු ස්වරය
(1) වාදි (2) සංවාදි (3) අනුවාදි (4) විවාදි

09 රිගු රිම ගුරි සු- | ධනි සරි ගුරි ස- යන තානාලංකාර යෙදෙන්නේ,
(1) භූපාලි (2) කාෆි (3) භීමපලාශ්‍රී (4) භෛරවී

10 ෂ්‍යාහි නමින් හඳුන්වනු ලබන්නේ තබ්ලාවේ
(1) වරපටිවලටයි. (2) ලී කුට්ටිවලට යි.
(3) කැපූ හම කොටසටයි. (4) බදාම කොටසටයි.

11 නාදය උස් හඬින් හා පහත් හඬින් ගායනය හෝ වාදනය කිරීම
(1) විපුලතාවයයි. (2) තාරතාවයයි. (3) ධ්වනි ගුණයයි. (4) රූප භේදයයි.

12 ධෛවතය, ගාන්ධාරය, වාදි සංවාදි වශයෙන් යෙදෙන රාග යුගලය වන්නේ,
(1) කාෆි - භීමපලාශ්‍රී (2) යමන් - භෛරවී
(3) බිලාවල් - කමාජ් (4) බිලාවල් - භූපාලි

13 ''කඳුපෙළ අතරේ තුරු වදුලේ'' යන ශුද්ධ ස්වර ස්ථාපන ගීතයේ අවසාන පදයට අයත් ස්වර ප්‍රස්තාරය වන්නේ,
(1) ස ස ග ග | රි රි ග - | ස ස රි රි | ග - - -
(2) ස ස රි රි | ග - ම - | ස රි ග ම | ප ධ ප -
(3) ප - ප - | ම - ප ම | ග - ම ග | රි - - -
(4) ස රි ග ම | ප - - - | ප ම ග රි | ස - - -

14 ග්‍රැමෆෝන් ගී යුගයේ මුල් වකවානුවේ විශිෂ්ට ගායකයෙකු වශයෙන් ප්‍රචලිත වූවෙකි
(1) පණ්ඩිත් අමරදේව (2) ආනන්ද සමරකෝන්
(3) ආර්. මුත්තුසාමි (4) එච්. ඩබ්. රූපසිංහ

15 බෝල් තාන යනු
(1) ස්වර වලින් පමණක් ගායනය කිරීම.
(2) ස්වර අලංකාර වලින් යුත් කතා
(3) රාගයේ වචන යොදාගැනීම
(4) ක්‍රමවත් ආරෝහණයක් හා අවරෝහණයකින් යුත් තාන

● අංක 16 - 20 දක්වා වූ ප්‍රශ්නවලට පහත සඳහන් සර්ගම් ගී පාද ඇසුරු කරගනිමින් පිළිතුරු සපයන්න.

(a) ග ග ප ධ | ප සි සි සි | නි රි ගි රි | සි නි ධ ප
(b) ම ම ප ධ | නි නි සි - | රි ගි රි සි | නි ධ නි -
(c) නි ස ග ම | ධ ම ධ නි | සි - සි - | ගි ගි රි සි
(d) ග ග ප ධ | ප සි - සි | ධ ධ සි රි | ගි රි සි ධ
(e) ම ප | ම ග ම | ප නි | ප නි සි

16 භූපාලි රාගයට අයත් සර්ගම් ගී පාදය අයත් වන්නේ,
(1) a (2) b (3) c (4) d

17 ග, නි වාදි සංවාදි වන රාගයට අයත් සර්ගම් පාදය අයත් වන්නේ,
(1) e (2) b (3) a (4) c

18 උදේ කාලයේ ගැයුමට සුදුසු රාගයේ සර්ගම් ගී පාදය අයත් අංකය වන්නේ,
(1) c (2) d (3) a (4) b

19 (e) කොටසට අයත් සර්ගම් ගී පාදයට අදාළ තාලය වන්නේ,
(1) දාදරා (2) ජප්තාල් (3) දීප්චන්දි (4) ත්‍රිතාලය

20 කාෆි මේලගත රාගවලට අයත් අංක වනුයේ,
(1) a, b (2) b, c (3) d, e (4) c, d

21 ජග්ගිත් සිං, ගුලාම් අලි, පන්කජ් උදාස් වැනි සංගීතඥයින් හා බැඳි ගායන විශේෂය වන්නේ,
(1) තුම්රි (2) කව්වාලි (3) ගසල් (4) භජන්

22 රාගයක් හඳුනාගැනීම සඳහා යොදාගනු ලබන කෙටි ස්වර සමූහය හඳුන්වනු ලබන්නේ,
(1) අලාපයි (2) මුඛ්‍යාංගයයි (3) සර්ගම් (4) තානාලංකාර

23 භූපාලි රාගය ආශ්‍රිත සරල ගීතයක් වන්නේ,
(1) අඳුර අඳුර මගේ (2) ගුමු ගුමුව වඳුලේ
(3) සැඳෑ අඳුර ලොව (4) සාඳු දන්තදා

24 තාල රූප දෙකෙන් වැයෙන සබරගමු වන්නමකි
(1) උකුසා (2) කොවුලා (3) තිසරා (4) හනුමා

25 මිස්රාබය, කඩිප්පුව, පික්, ක්වාලම් යන උපකරණ තුළින් සිතාරය වාදනය සඳහා යොදාගනු ලබන්නේ,
(1) මිස්රාබය (2) කඩිප්පුව (3) පික් (4) ක්වාලම්

26 රාගයක වාදි ස්වරයේ සිට 4 වන හෝ පස්වන ස්වරය යෙදෙනුයේ
(1) විවාදි ස්වරයයි. (2) සංවාදි ස්වරයයි.
(3) අනුවාදි ස්වරයයි. (4) වාදි ස්වරයයි.

27 සු / නිල් / වන්නු / වන් / යුගව යන ගී පාදයට ගැලපෙන තාලය වනුයේ,
(1) ත්‍රි තාලය (2) දාදරා තාලය (3) කෙම්ටෝ තාලය (4) ජප් තාලය

28 සිතාරයේ තානාලංකාර වාදනය කිරීම හඳුන්වනු ලබන්නේ,
(1) පකඩ් යනුවෙනි. (2) තෝඩා යනුවෙනි.

(3) ගමක් යනුවෙනි. (4) පරන් යනුවෙනි.

29 ''අන්න බලන් සඳ'' යන නාට්‍ය ගීතයට සංගීතය සපයා ඇත්තේ,

(1) එදිරිවීර සරච්චන්ද්‍ර (2) සෝමදාස ඇල්විටිගල

(3) සතිස්චන්ද්‍ර එදිරිසිංහ (4) ආනන්ද සමරදිවාකර

30 ප්‍රේමසිරි කේමදාසයන් සංගීතවත් කළ ගීතයක් නොවන්නේ,

(1) උදුම්බරා හිනැහෙනවා (2) අම්මාවරුනේ

(3) අඳුර කුටිය තුළ (4) ඉඳුනිල් ගඟුලැල්

31 සබරගමු වන්නමක අඩංගු කොටස් වනුයේ,

(1) බෙරපදය, තානම, කවිය, ඉරට්ටිය (2) තානම, කවිය, බෙරපදය, අඩච්ච

(3) තානම, කවිය, බෙරපදය, කලාසම (4) තානම, කවිය, කලාසම, අඩච්ච

● අංක 32 - 36 දක්වා වූ ප්‍රශ්නවලට පහත රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.

A  B  C  D 

32 කඩිප්පුව යොදාගෙන වාදනය සිදුකරන වාද්‍ය භාණ්ඩයට අයත් අංකය වනුයේ,

(1) A (2) B (3) C (4) D

33 කෝලම් නාට්‍ය සඳහා යොදාගනු ලබන වාද්‍ය විශේෂයට අයත් අංකය වනුයේ,

(1) A (2) B (3) C (4) D

34 ඉහත භාණ්ඩ අතරින් දේශීය වාද්‍ය භාණ්ඩ වලට අයත් නොවන භාණ්ඩය ඇතුළත් වන්නේ,

(1) A (2) B (3) C (4) D

35 ජි ං කි | ට ත ත් | ත ත් කි | ටි ත ක යන අවනද්ධාක්ෂර වාදනයට යොදාගන්නා වාද්‍ය භාණ්ඩය වන්නේ,

(1) A (2) B (3) C (4) D

36 ඉරට්ටිය වාදනය කිරීමට යොදාගනු ලබන වාද්‍ය භාණ්ඩය වන්නේ,

(1) A (2) B (3) C (4) D

37 ම ස්වරය ශ්‍රැති ස්වරය ලෙස ගැනීමේ දී යෙදෙන විකෘති ස්වරය වන්නේ,

(1) ග (2) ම් (3) නි (4) ම

38 සංධවනියක ඇතුළත් නොවන භාණ්ඩයකි

(1) වයලීන් (2) සිතාර් (3) ත්‍රොම්බෝන් (4) ක්ලැරිනට්

39 එක් ස්වරයක් සඳහා තත් දෙක බැගින් යොදාගන්නා හින්දුස්ථානි වාද්‍ය භාණ්ඩය

(1) සිතාර් (2) ගිටාර් (3) සන්තූර් (4) එස්රාජ්

40 ස්වර ලිපියක් අවශ්‍ය වනුයේ,

(1) ගායනයේ දී (2) වාදනයේ දී (3) සංරක්ෂණයේ දී (4) රසවිඳීමේ දී

(1 x 40 = 40)

## II කොටස

● **පළමුවන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

01 (1) මධ්‍යමය වාදි හා ෂඩ්ජය සංවාදි ලෙස යෙදෙන රාගය නම් කරන්න.

(2) සිංහබාහු නාට්‍යය නිෂ්පාදනය කළේ කවුරුන් විසින්ද?

(3) ස ධ ස රි ග , ග ප ධ ප යන ස්වර සංගතිය යෙදෙන රාගය නම් කරන්න.

(4) කුට තාන සඳහා භාවිතා වන තවත් නමක් සඳහන් කරන්න.

(5) ග රි නි රි | ස - - | නි රි ග ම | ප ම ග ප | රි ග රි ස මෙහි සඳහන්ව ඇත්තේ කිසියම් රාගයකට අයත් ලක්ෂණ ගීතයක ස්වර පාදයකි. එම රාගය හඳුනාගෙන රාගයට අදාළව ස්වර නිවැරදි කරන්න.

(6) එම රාගය කුමක්දැයි හඳුන්වන්න.

(7) පහතරට ප්‍රදේශයට ආවේනික සිංදු වන්නම් ගණන කීයද?

(8) කෝකිල වන්නමෙහි ත්‍රානම ලියා දක්වන්න.

(9) ස - සස ස | ස -ස ස

ඉහත ස්වර පේළිය බටහිර සංගීතයට අනුව ලියා දක්වන්න.

(10) රේඛාව චිත්‍රපටයට අයත් ගීතයක් සඳහන් කරන්න. (ල. 12)

02 (1) පහත සඳහන් ස්වර ප්‍රස්තාර අයත් රාග නම් කරන්න.

(1) ස ස රි ගු | රි ගු ස රි | ප - - ම | ගු රි ස -

(2) ග - ම රි | ග ප ධ නි | ස - ධ ප | ධ නි ස -

(3) ස රි ග රි | ස ස ධ ප | ග - රි ස | ධ ධ ස -

(4) නි ස ගු ම | ප ගු - ම | ග - රි නි | ස - - -

(5) නි රි ග ම′ | ප - ග ම′ | ප - ග රි | නි රි ස -

(2) ඉහත 1 හෝ 2 කොටස් වලට අයත් රාගයක මධ්‍යලය ගීතය ප්‍රස්තාර කරන්න. (ල. 04)

(3) 3 කොටසට අයත් සර්ගම් ගීතයේ ස්ථායි කොටස ප්‍රස්තාර කරන්න. (ල. 04)

(4) 5 කොටසට අයත් රාගයට අදාළව තානාලංකාර 2 ක් ලියා දක්වන්න. (ල. 04)

03 පහත සඳහන් පෙරදිග ස්වර ප්‍රස්තාර බටහිර ක්‍රමයට අනුව ප්‍රස්තාර කරන්න.

(1) 1. + + ග ප | ම - ග රි | ස - - - | රි - ග ප

ම - - ගුරි | ග - - රිස | රි - ග - | ස - - -

2. ප ග - | - රි ස | රි - ග | ප - - | ධ ම - | - ප ධ | නි - ධ | ස - - (ල. 06)

(2) ඉහත බටහිර ප්‍රස්තාර සඳහා අදාළ Time Signature ලියා දක්වන්න. (ල. 02)

(3) 2 කොටසට අයත් ප්‍රස්තාරය මධ්‍යම භාවයට ලියා දක්වන්න. (ල. 04)

04 පහත දක්වෙනුයේ ශ්‍රී ලංකාවේ චිත්‍රපට සංගීතය සම්බන්ධයෙන් සුවිශේෂී චිත්‍රපට කිහිපයකි. ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(a) මාතලන් (b) රේඛාව (c) සත්සමුදුර (d) නිධානය

(e) සංදේශය (f) දුලීකා

(1) රේඛාව චිත්‍රපටය හා එහි සංගීතය පිළිබඳව සඳහන් කළහැකි විශේෂ කරුණු 4 ක් ලියන්න. (ල. 04)

(2) a අක්ෂරයෙන් දක්වා ඇති චිත්‍රපටයේ

සංගීත අධ්‍යක්ෂක / ගායක ගායිකාවන් දෙදෙනෙක් සහ ජනප්‍රිය ගීත දෙකක් ලියා දක්වන්න. (ල. 02)

(3) ප්‍රේමසිරි කේමදාස මහතා සංගීත නිර්මාණය කළ චිත්‍රපට 2 ක් නම් කරන්න.